මව්බිම FT

38 වසරක් සපුරමින් කාගිල්ස් ෆුඩ් සිටි අභිමානවත් ඉදිරිගමනක

කාගිල්ස් ෆුඩ් සිටි ආරම්භයේ සිටම ක්‍රියාත්මක වී ඇත්තේ සිය පාරිභෝගිකයන් හට අඩුම මිලට වැඩිම වටිනාකමක් ලබා දෙන අතරේ ගොවීන්ට සහ සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට වෙළෙඳපොළක් නිර්මාණය කිරීම අරමුණු කරගනිමිනි. සුපිරි වෙළෙඳසල් අත්දැකීම ඉහළ පෙළැන්තියට පමණක් සීමා වූ කාල වකවානුවක් වන 1983 වසරේ සිය මෙහෙයුම් ආරම්භ කළ ෆුඩ් සිටි වෙළෙඳසල් ජාලය සමස්ත මහජනතාවට මෙම අත්දැකීම සමීප කරදීමේ පුරෝගාමියා බවට පත් වුණි. ආරම්භයේ පටන්ම ෆුඩ් සිටි හි අරමුණ වූයේ සිය පාරිභෝගිකයන්ගේ ජීවන වියදම අඩු කිරීමය. මෙම අරමුණ ඉටු කිරීම වෙනුවෙන් විවිධ වැදගත් ආයෝජනයන් සිදු කර ඇති අතර මේ වනවිට සමාගම සතුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළ ක්‍රියාත්මක වන ශාඛා 471ක් පවතී.

පළමු ශාඛාව 1983දී ස්ටේප්ල්ස් මාවතේදීද, 100 වැනි ශාඛාව 2007දී කළුතරදීද, 200 වැනි ශාඛාව 2013දී පිළියන්දලදීද, 300 වන ශාඛාව 2016දී ඇල්පිටියේදීද, 400 වන ශාඛාව 2019 වත්තලදීද විවෘත කරන ලදී.

කාගිල්ස් සිය වෙළෙඳාම් ජාලය අංශ තුනක් කරා යොමු කර ඇත. ඒවා නම් ෆුඩ් සිටි සුපිරි වෙළෙඳසල් කාගිල්ස් එක්ස්ප්‍රස් වෙළෙඳසල් සහ කාගිල්ස් ෆුඩ් හෝල් වෙළෙඳසල්ය. එසේම ඉහළ යන ඔන්ලයින් ඉල්ලුමට සරිලන්නට කාගිල්ස් ඔන්ලයින් ආරම්භ කරනු ලැබුවේ 2020දීය. අද වනවිට ෆුඩ් සිටි රටේ සුපතළ නාමයක් බවට පත්වී ඇත්තේ විශ්වසනීය ප්‍රමිතිය දිවයින පුරා හැමතැන ව්‍යාප්තව තිබීම පහසුව සහ අඩුම මිල වෙනුවෙන් දැරූ විශ්වාසය නිසාවෙනි. අදවන විට ෆුඩ් සිටිහි අඩුම මිල සහතිකය දිවයින පුරා මිලගණන් සම්බන්ධයෙන් මිනුම් ලකුණක් බවට පත්ව ඇත.

හඟුරන්කෙත ප්‍රදේශයේ ගොවි ප්‍රජාව මුහුණ දෙන අභියෝගවලට සවන්දීම සඳහා සමාගමේ නිලධාරීන් 1999 වසරේදී කළ සංචාරයකින් පසුව දේශීය ගොවීන් සහ සුපිරි වෙළෙඳසල් ජාලය අතර සෘජු සම්බන්ධතා ඇරඹිණි. එතැන් සිට කාගිල්ස් ෆුඩ් සිටි විසින් විවිධ සේවාවන් හඳුන්වාදෙමින් කෘෂි ව්‍යාපෘති හරහා ගොවියන්ව සවිගන්වමින් සිටින්නේ ශ්‍රී ලංකාවේ විශාලතම පලතුරු සහ එළවළු එකතු කරන්නා බවට පත් වෙමිනි. රටපුරා පැතිර ඇති එකතු කිරීමේ මධ්‍යස්ථාන 11කින් එකතු කරගන්නා නැවුම් අස්වැන්න පැය 24ක් ඇතුළත ෆුඩ් සිටි ශාඛාවලට බෙදා හැරේ. ජාතික එළවළු සහ පලතුරු අස්වැන්නෙන් 2%කට වඩා වැඩි ප්‍රමාණයක් කාගිල්ස් ෆුඩ් සිටි සුපිරි වෙළෙඳසල්වල අලෙවිවේ. සෑම දිනකම කාගිල්ස් විසින් නැවුම් අස්වැන්න මෙට්‍රික් ටොන් 120ක් පමණ එකතු කරනු ලබයි.

දේශීය ගොවි ප්‍රජාවට සවිමත් වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට අමතරව සමාගම විසින් කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීමටද සැලකිය යුතු ආයෝජනයන් සිදු කර ඇත. සිය කෘෂි නවීකරණ ව්‍යාපෘතිය හරහා කාගිල්ස් ෆුඩ් සිටි යහපත් කෘෂි පිළිවෙත් හඳුන්වාදෙමින් ගොවියන්ට වැඩි ඵලදාවක් සහ වැඩි ආදායමක් පමණක් නොව වඩාත් සෞඛ්‍යාරක්ෂිත යහපත් පෝෂණය සපිරි අස්වැන්නක් නෙළා ගන්නට මග පෙන්වයි. සමාගම ගොවීන්ට පුහුණු වැඩසටහන් සැපයීම සඳහාද ආයෝජනය කරන අතර මේ යටතට ජාත්‍යන්තර යහපත් කෘෂි පිළිවෙත් පිළිබඳවද ඔවුන් දැනුවත් කරන්නේ ඒවා සජීවීව අත්විඳීමට පවා අවස්ථාව උදා කරදෙමිනි. කෘෂි නවීකරණ ව්‍යාපෘතියේ වැදගත්ම ප්‍රතිඵලයක් ලෙස කාගිල්ස් ෆුඩ් සිටි හි අලෙවි කෙරෙනා 'ගුඩ් හාවස්ට්' හැඳින්විය හැකිය. මේවා වගා කරනු ලබන්නේ GAP සහතිකය යහපත් කෘෂි පිළිවෙත් ලැබූ ගොවියන් විසිනි. එසේම BeeSafe නාමය යටතේ කාගිල්ස් හි 100%ක් කෘෂි රසායනවලින් තොර නැවුම් අස්වැන්න මිලදී ගැනීමේ හැකියාවද පවතී

එසේම කාගිල්ස් සිය ගොවි ප්‍රජාවගේ පවුල්වලටද සහයෝගය ලබාදෙන්නේ එම දරු දැරියන්ට අධ්‍යාපන ශිෂ්‍යත්ව සහ ලැප්ටොප් සපයන අරමුදලක් හරහාය. එසේම ගොවීන්ව අස්වැන්න පාලුවීමෙන් ඇතිවන අලාභයෙන් ආරක්ෂා කිරීමට ණය රක්ෂණ වැඩසටහනක්ද මේ වනවිට හඳුන්වා දී ඇත.

කාගිල්ස්හි වෙළෙඳ ජාලය දිවයිනේ විවිධ පළාත්වල සංවර්ධනයට රුකුලක් වන්නේ විශාල වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට නිරන්තර ආයෝජනයන් සපයමින් සහ දේශීය ගොවීන්ගේ සහ ව්‍යවසායකයන්ගේ ඉල්ලුම වැඩි කරමින් ඔවුන්ගේ ජීවනෝපායට සහාය වෙමිනි. එසේම තරුණ තරුණියන්ට ජාත්‍යන්තරව පිළිගත් සහතික සහ පුහුණු වැඩසටහන් සපයන Albert A. Page Institute තවත් වැදගත් වෘත්තීය අවස්ථා සපයන කාගිල්ස් ව්‍යාපෘතියක්වේ. සියලුම සබඳතරුවන්ගේ සහයෝගයෙන් සහ දායකත්වයෙන් ශක්තිමත්ව සිටිනා සමාගම සිය ප්‍රවේශයන් තවත් පුළුල් කරමින් තම පාරිභෝගිකයන් සමඟ වඩාත් සමීපවීමට උත්සාහ දරන්නේ ගෙවන මුදලට වැඩි වටිනාකමක් සහ පෝෂණයක් නිරන්තරයෙන් ඔවුන්ට සපයන්නට තවදුරටත් කැප වෙමිනි.

HNB 2021 මුල් මාස 9 සඳහා ශක්තිමත් මූල්‍ය ප්‍රතිඵල වාර්තා කරයි

2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස 9ක කාල සීමාව සඳහා රුපියල් බිලියන 12.2ක බදු පසු ලාභයක් වාර්තා කිරීමට හැටන් නැෂනල් බැංකුව (HNB) සමත් වූයේ නම්‍යශීලී ව්‍යාපාරික ආකෘතියක් හා අඛණ්ඩ තිරසර ව්‍යාපාර ආකෘතියක් වෙනුවෙන් වූ සිය කැපවීම යළි යළිත් අවධාරණය කරමිනි. මේ අතර අදාළ කාල සීමාව සඳහා HNB සමූහය රුපියල් බිලියන 13.4 බදු පසු ලාභයක් වාර්තා කිරීමට සමත්ව ඇත.

පසුගිය මාස 12ක කාලය තුළ රුපියල් බිලියන 118ක වර්ධනයක් සමඟ සිය ණය කළඹ 15%ක පමණ සාර්ථක වර්ධනයක් අත්කර ගැනීමට HNB සමත් වී තිබේ. විශේෂයෙන් 2021 අගෝස්තු මාසයේදී සිදු කළ සංශෝධනයන් තුළින් ප්‍රතිපත්ති අනුපාතයන් හි ඉහළ යෑමෙන් පසු ප්‍රමුඛ ණය අනුපාතය (PLR) ද ඉහළ යන ලදී. කෙසේවෙතත් මෙම වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය 2020 වසරේ අදාළ කාල පරිච්ඡේදය තුළ පැවති සාමාන්‍ය අනුපාතයට වඩා දළ වශයෙන් පදනම් ලක්ෂ 300කින් පහළ යෑමක් පෙන්නුම් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසරට සාපේක්ෂව මාස 9ක කාලය සඳහා වූ පොලී ආදායම 8.9%කින් පහළ ගොස් රුපියල් බිලියන 72.5ක් බවට පත් විය.

සැප්තැම්බර් මාසය වනවිට රුපියල් බිලියන 52.9කින් ඉහළ ගොස් රුපියල් බිලියන 436.6ක් දක්වා වර්ධනය වූ CASA හි ක්‍රියාකාරීත්වය හේතුවෙන් තැන්පතුවල සාමාන්‍ය පිරිවැයෙහි සමානත්වයක් දැකිය හැකි වූ අතර ඒ හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව පොලී වියදම 19.3%කින් අඩු වී රුපියල් බිලියන 37ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොලී ආදායම (NII) 5.2%කින් වර්ධනය වී රුපියල් බිලියන 35.6ක් බවට පත් වී ඇත. 2020 සැප්තැම්බර් මාසයේ සිට මාස 12ක් පුරා සමස්ත තැන්පතුවල වර්ධනය 15%ට අඩු අගයක් පවත්වා ගෙන යෑමට බැංකුව සමත්ව ඇති අතර මේ සඳහා ජංගම ගිණුම් හා ඉතුරුම් ගිණුම් පොලිය අතර වෙනස මනාව කළමනාකරණය කර ගැනීමද ඉවහල් වී ඇත.

සභාපතිනි
අරුණි ගුණතිලක

කළමනාකාර අධ්‍යක්ෂ /
ප්‍රධාන විධායක නිලධාරී
ජොනතන් අලස්

පෙරවන කාර්තුවේ මූල්‍ය ප්‍රතිඵල සම්බන්ධයෙන් අදහස් දැක්වූ HNB සභාපතිනි අරුණි ගුණතිලක මහත්මිය සඳහන් කර සිටියේ "සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් තුළ HNB විසින් අඛණ්ඩව එකම අරමුණක් හා ස්ථාවරත්වයක් ප්‍රදර්ශනය කිරීමට සමත්වීම පිළිබඳව ඉතාමත් සතුටුයි. අපගේ විශ්වාසවන්ත ගනුදෙනුකරුවන්ගේ අඛණ්ඩ දායකත්වය හා විවිධ අභියෝග ජය ගැනීම වෙනුවෙන් වන HNB කණ්ඩායමේ උත්සාහය හා කැපවීම සම්බන්ධයෙන් ඔවුන් සියලුදෙනාට මගේ ස්තුතිය මේ මොහොතේ පුද කර සිටිනවා." යනුවෙනි.

"ශ්‍රී ලංකාව යළි යථා තත්ත්වයට පත්වීමේ මාවතට අවතීර්ණ වීමේදී සාර්ව ගැටලු විසඳීමට මෙන්ම ස්ථාවරත්ව හා තිරසර ආර්ථික වර්ධනය වෙනුවෙන් ඔවුන්ගේ සහයෝගය ඉහළ නැංවීම සඳහා බැංකු ක්ෂේත්‍රයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව මගේ විශ්වාසයයි. එසේම අපගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ලබාදීමට මෙන්ම රටේ සංවර්ධනය වෙනුවෙන් දායකවීමට HNB අඛණ්ඩව කටයුතු කරන බවද මෙහිදී සඳහන් කළ යුතුයි." යනුවෙන් ඇය වැඩිදුරටත් පැවැසුවාය. පසුගිය කාලය පුරා සිදුවූ රට වසා තැබීමේ තත්ත්වයන් හේතුවෙන් 2021 වසරේ ව්‍යාපාරික කටයුතුවලට වරින් වර බාධා එල්ල වුවද, ගාස්තු හා කොමිස් ආදායම 22.8%කින් ඉහළ නංවා ගනිමින් රුපියල් බිලියන 6.7ක් දක්වා වර්ධනය කර ගැනීමට බැංකුව සමත් වූ අතර විශේෂයෙන්ම ඩිජිටල් ව්‍යාපාරික සේවාවන් මත පදනම් වූ ගාස්තු හා කොමිස් සමඟ කාඩ් පත් හා වෙළෙඳ ව්‍යාපාරද ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රතිඵල පිළිබඳව අදහස් දැක්වූ HNB කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ජොනතන් අලස් මහතා සඳහන් කර සිටියේ "දිගු කාලයක් පුරා පැවැති දැඩි අවිනිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ශ්‍රී ලංකාව බැංකු ක්ෂේත්‍රයේ ඔරොත්තුදීමේ හැකියාව මනාව පෙන්නුම් කර තිබෙනවා. දේශීය වශයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන සුවිශේෂී වාණිජ බැංකුවක් ලෙස ඉහළ වත්කම් තත්ත්වයක් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා මට්ටම් වාර්තා කරමින් යහපත් හා තිරසර ප්‍රතිලාභ ලබා දෙමින් HNB නිරන්තරයෙන් පුරෝගාමී මෙහෙවරක යෙදෙන බවත් මෙහිදී සඳහන් කළ යුතුයි" යනුවෙනි.

බෙල්ට්‍රෝන් ශ්‍රවණ උපකරණ දැන් එරික් රාජපක්ෂ ආයතනයෙන්

එරික් රාජපක්ෂ දෘෂ්ටි විශේෂඥයෝ වසර 100කට වඩා වැඩි කාලයක් ඔබගේ දෙනෙතට හොඳම දේ පහසු අයුරින් ලබාදීමට විශ්වාසය දිනා සිටින ආයතනයකි.

දැනට කොළඹ දිස්ත්‍රික්කය පුරාවට පවතින එරික් රාජපක්ෂ ශාඛා ජාලය ඔස්සේ අපගේ නවතම "ශ්‍රවණ අංශය" දැන් ඔබගේ සේවා සඳහාම විවෘතයි. පළපුරුදු ශ්‍රවණවේදීන්ගේ හා ශ්‍රවණ උපකරණ පිළිබඳව විශේෂඥයන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලය ඔබගේ සේවාව සඳහාමයි.

"පැහැදිලි ඇසීමක්" නවීන තාක්ෂණය ඔස්සේ ඔබගේ ජීවිතයට ලබාදීම අපගේ අරමුණයි. ඒ සඳහා ලොව සුපතළ ඩෙන්මාර්කයේ නිෂ්පාදිත බෙල්ටොන් ශ්‍රවණ උපකරණ (Belton Hearing Aids) වඩා වැඩි විශ්වාසයකින් යුතුව අප ඔබ වෙත ළඟා කරන්නෙමු. අන්තර්ජාතික වශයෙන් හා දෙස් විදෙස් පාරිභෝගිකයන්ගේ ඉමහත් විශ්වාසය දිනා සිටින බෙල්ටොන් (Belton) දැන් වසර 2ක වගකීමක් සහිතව එරික් රාජපක්ෂ ආයතනයෙන් දැන් ලබාගත හැකිය.

මෙහිදී කන පිටතින් පලඳින ශ්‍රවණ උපකරණ (Behind the ear (BTE) වල සිට කන තුළ පලඳින ඉතා කුඩා ශ්‍රවණ උපකරණ (Customize hearing aid) දක්වාම ඉතා අනර්ඝ නිමාවකින් යුතුව ඔබගේ ශ්‍රවණ තත්ත්වයන්ටම ගැළපෙන පරිදි සුවිශේෂී වර්ග සිහිපයකින්ම නවීන ශ්‍රවණ උපකරණ රැසක් එරික් ආයතනයෙන් ලබාගත හැකිය. මේ පමණක්ම නොවේ විශේෂයෙන්ම අලෙවියෙන් පසු සේවාවන් සියල්ල ඔබ වෙත ලබාදීමට අපි බැඳී සිටින්නෙමු. එසේම නිවෙසටම පැමිණ ඔබගේ අවශ්‍යතාව පරිදි ශ්‍රවණ පරීක්ෂණ හා ශ්‍රවණ උපකරණ ලබාදීමේ පහසුකමද ඔබට සලසා ඇත.

ඇසීම හා සම්බන්ධ ප්‍රධාන ගැටලු

ඇසීම අඩුවීමක් සමඟ පුද්ගලයන් මුහුණපාන ප්‍රධාන ගැටලුවක් වනුයේ, හඬේ ඇති පැහැදිලිභාවය අඩු වීමයි. රූපවාහිනිය (TV) ගුවන්විදුලිය (Redio) ඇසීමේදී, බැලීමේදී, කාර්යාලයේදී හෝ දුරකථන සංවාදවලදී ඇසීමේ තරමක අඩු බවක් ඔවුන්ට හෝ පවුලේ සාමාජිකයන්ද වටහාගත හැකියි.

බෙල්ටොන් ශ්‍රවණ උපකරණ (Belton Hearing Aids) මේ තත්ත්වය හොඳින් හඳුනාගෙන මෙයට විසඳුමක් සපයමින් නවීන තාක්ෂණයෙන් නිපදවා ඇත. බ්ලූටූත් (Bluetooth) තාක්ෂණ ඔස්සේ දුරකථනවලට සම්බන්ධ කිරීමේ හැකියාවද මෙහි ඇත.

දැනට බෙල්ටොන් ශ්‍රවණ උපකරණ (Belton Hearing Aids) එරික් රාජපක්ෂ දෘෂ්ටි ආයතනයේ ප්‍රධාන ශාඛාව, කොල්ලුපිටිය ඇතුළු දෙහිවල, වැල්ලවත්ත, කිරිබත්ගොඩ, මාලඹේ යන ශාඛාවලදී ඔබටම ලබාගත හැකිය.

ලොකු කුඩා, බාල, මහලු ඕනෑම අයකුට ගැළපෙන පරිදි ඕනෑම ශ්‍රවණ තත්ත්වයකට විසඳුම් හා සේවා ලබාදීමට අපි කැපවී සිටිමු.

"යූනියන් ඇෂුවරන්ස් ප්‍රිමියර් ක්ලබ්" ජයග්‍රාහකයන්ට ත්‍යාග පිරිනැමේ

ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ දැවැන්තම ත්‍යාග වැඩසටහන මෙන්ම, වඩාත්ම ආකර්ෂණීය ත්‍යාග පිරිනමන වැඩසටහන ලෙස සැලකෙන "යූනියන් ඇෂුවරන්ස් ප්‍රිමියර් ක්ලබ්" යටතේ සුදුසුකම් ලැබූ ප්‍රථම රක්ෂණ නියෝජිතයන් කණ්ඩායමට ත්‍යාග පිරිනැමීමේ උත්සවය 2021 නොවැම්බර් 07 වැනි දින කොළඹ ෂැංග්‍රිලා හෝටලයේදී පැවැත්විණි. විශිෂ්ට පාරිභෝගික සේවාවක් සමඟින් ජාත්‍යන්තර තලයේ විකිණුම් කුසලතා ප්‍රදර්ශනය කරන රක්ෂණ උපදේශකවරුන් ඇගයීමට ලක්කිරීම සඳහා යූනියන් ඇෂුවරන්ස් සමාගම විසින් "යූනියන් ඇෂුවරන්ස් ප්‍රිමියර් ක්ලබ්" හඳුන්වා දෙන ලදී.

"යූනියන් ඇෂුවරන්ස් ප්‍රිමියර් ක්ලබ්" වැඩසටහන යටතේ ඇගයීමට ලක්වන මුල්ම කණ්ඩායමට මගේ උණුසුම් සුබපැතුම් මෙසේ පිරිනමනවා. අපගේ රක්ෂණ නියෝජිත බළකාය එහි හැකියාවන් හා පාරිභෝගික කේන්ද්‍රීයත්වය සම්බන්ධයෙන් නව මානයක් වෙත රැගෙන යෑමට අප උත්සාහ දරමින් සිටින මේ මොහොතේ, මේ මුල්ම ජයග්‍රාහකයන් කණ්ඩායම රක්ෂණ ක්ෂේත්‍රය තුළ පෙරළියක් ඇතිකරමින් සිටිනු දැකීම අපමණ සතුටක්." යූනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ජූඩ් ගෝමස් මහතා පැවසීය.

"යූනියන් ඇෂුවරන්ස් ප්‍රිමියර් ක්ලබ්" ජයග්‍රාහකයන්ට මෙම උත්සවයේදී ත්‍යාග හා දීමනා රැසියක් පිරිනැමිණි. මෙම ත්‍යාග අතරට සමාගම මගින් නඩත්තු කරනු ලබන සුඛෝපභෝගී වාහනයක්, ඉන්ධන සහ මුදල් ත්‍යාගද ඇතුළත් විය. "යූනියන් ඇෂුවරන්ස් ප්‍රිමියර් ක්ලබ්" යනු ඉහළම මට්ටමේ රක්ෂණ නියෝජිතවරුන්ගෙන් සමන්විත සුවිශේෂී සමාජයක්. විකිණුම් කටයුතු හා පාරිභෝගික සේවාව සම්බන්ධයෙන් විශිෂ්ටතම දක්ෂතා දක්වන රක්ෂණ නියෝජිතයන්ට මේ සුවිශේෂී සමාජයට ඇතුළු වීමට අවස්ථාව ලැබෙනවා. මේ ආකාරයට අපගේ විකිණුම් කණ්ඩායම වෙනුවෙන්, ක්ෂේත්‍රයේ විශිෂ්ටතම ත්‍යාග වැඩසටහන හඳුන්වාදීමට හැකිවීම අපට මහත් සතුටක්. සමාගමක් ලෙස අපගේ අරමුණ වන්නේ, ශ්‍රී ලාංකිකයන්ගේ සිහින සහ ජීවන රටාවන්ට රැකවරණය දෙමින් ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ අලෙවිය වැඩි කිරීමයි. මේ අරමුණ යථාර්ථයක් බවට පත්කිරීමේදී මේ විශිෂ්ට තලයේ රක්ෂණ නියෝජිතයන් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනවා." යූනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන බෙදාහැරීම් නිලධාරී සෙනත් ජයතිලක මහතා පැවසීය. "යූනියන් ඇෂුවරන්ස් ප්‍රිමියර් ක්ලබ්" වැඩසටහනේ මුල්ම කණ්ඩායම ලෙස සුදුසුකම් ලැබුවේ උපුල් ප්‍රියන්ත, චාමර මෙන්ඩිස්, හේරත් මුදියන්සේලාගේ, චානක අප්පුහාමි, සඳුන් සිරිවර්ධන, මලින්ත ගුරුසිංහ, අමිල හර්ෂණ, තයෝමි මීගහපොළ, තරිඳු කුරුප්පු, උදාන් සිල්වා, ජීවන් විජේකෝන්, සුරේෂ් බණ්ඩාර, කුමාරසිරි රාමනායක, මහේෂ් ප්‍රනාන්දු, උපාලි විජේසූරිය, සහ රොහාන් විජේවර්ධන යන අයයි. මෙම 16 දෙනා Million Dollar Round Table (MDRT) සාමාජිකත්වය සඳහාද සුදුසුකම් ලබා තිබේ.

කොළඹ 07, රෝස්මිඩ් පෙදෙසේ, අංක 101 හි පිහිටි [illegible] සිලෝන් නිව්ස්පේපර්ස් පෞද්ගලික සමාගම විසින් ජා ඇල, මිනුවන්ගොඩ පාර, 302/1/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.

Scanned with CamScanner